# <u>ප්‍රසම්පාදන දැන්වීම</u>

## <u>පරිගණක හා අනෙකුත් උපාංග මිළදී ගැනීම.</u>

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, හම්බන්තොට - ගාල්ල - මාතර සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල හා දකුණු පළාතේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශ වෙත බෙදා දීම සඳහා අවශ්‍ය පරිගණක යන්ත්‍ර සමඟ යූ.පී.එස්. යන්ත්‍ර 29ක්, , මුද්‍රණ යන්ත්‍ර 23ක්, යූ.පී.එස්.යන්ත්‍ර 05ක්, ලැප්ටොප් යන්ත්‍ර 02, ෆැක්ස් 01 හා Tab 01ක් මිළදී ගැනීම වෙනුවෙන් ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

02. මේ සඳහා ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කිරිමට අපේක්ෂා කරන්නේ නම් 2025.09.22 දින සිට 2025.10.02 දින දක්වා සතියේ වැඩකරන දින වලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගිණුම් ශාඛාවට පැමිණ මුදල් සහකාර වෙත ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තුව වන රු. 2,000/- ක මුදලක් ගෙවා අදාල අයදුම්පත ලබා ගත හැකිය.

| **භාණ්ඩ පිළිබඳ විස්තර** | සැපයිම කළ යුතු ස්ථානය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණය (රු.) | ආපසු නොගෙවන ලංසු ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| පරිගණක යන්ත්‍ර සමඟ යූ.පී.එස්. | අතුරලිය (1), යක්කලමුල්ල (1), හබරාදුව(1), තිහගොඩ (1), වැලිපිටිය (1), වදුරඹ (1), සූරියවැව(1), හක්මණ (1), අක්මීමන (1), තිස්සමහාරාමය (1), නෙළුව (1),බෝපේපොද්දල(1), කොටපොල (1), නාගොඩ (1), අම්බලන්ගොඩ (1), හම්බන්තොට(1), වැලිවිටිය දිවිතුර (1), කටුවන (1), අගුණුකොළපැලැස්ස (1), ලුණුගම්වෙහෙර (1), වලස්මුල්ල (1), වීරකැටිය (1) යන ප්‍රා.ලේ.කා. හා ගාල්ල ඉඩම් කොමසාරිස් දෙපා.(7) | 29 | 100,000/- | 2,000/- |
| මුද්‍රණ යන්ත්‍ර | ඕකෙවෙල (1),යක්කලමුල්ල (1) හබරාදුව (1)වදුරඹ (1),සූරියවැව(1), හක්මණ (1),බෙලිඅත්ත (1), අක්මීමන (1), තිස්සමහාරාමය (1), බෙන්තොට (1),නාගොඩ (1), කඹුරුපිටිය(1)වැලිවිටිය දිවිතුර (1), කටුවන(1),අගුණුකොළපැලැස්ස(1), ලුණුගම්වෙහෙර (1),වීරකැටිය (1) යන ප්‍රා.ලේ.කා. හා ගාල්ල ඉඩම් කොමසාරිස් දෙපා.(6) | 23 | | |
| යූ.පී.එස්. යන්ත්‍ර | ගාල්ල ඉඩම් කොමසාරිස් දෙපා.(5) | 05 | | |
| ලැප්ටොප් යන්ත්‍ර | ගාල්ල ඉඩම් කොමසාරිස් දෙපා.(1) | 02 | | |
| ෆැක්ස් යන්ත්‍ර | ගාල්ල ඉඩම් කොමසාරිස් දෙපා.(1) | 01 | | |
| ටැබ් යන්ත්‍ර | ගාල්ල ඉඩම් කොමසාරිස් දෙපා. (1) | 01 | | |

03.ලංසුව සමඟ ඉදිරිපත් කරනු ලබන ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ඕනෑම වානිජ බැංකුවකින් , දකුණු පළාත් ඉඩම් කොමසාරිස් නමට ලබාගත් 2025.12.18 දින දක්වා වලංගු බැංකු ඇපකරයක් හෝ දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබා දෙන මුදල් කුවිතාන්සියේ මුල් පිටපත ප්‍රසම්පාදන පත්‍රිකාව සමඟ ඉදිරිපත් කළ යුතුය.චෙක්පත් හෝ බැංකු අණකර ලෙස ඉදිරිපත් කරන ලංසු සුරක්ෂණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ඉදිරිපත් කරනු ලබන මිල ගණන් නියමිත අයදුම්පතෙහි පමණක් නිසි පරිදි විස්තර ඇතුළත් කොට සීල් තබා 2025.10.03 දින ප.ව. 2.00 ට පෙර දකුණු පළාත් ඉඩම් කොමසාරිස්, දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, අංක 211, වක්වැල්ල පාර, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේ ගණකාධිකාරී කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක.

05. තවද ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවර **"<u>පරිගණක හා අනෙකුත් උපාංග මිළදී ගැනීම</u> සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම"** යනුවෙන් සඳහන් කර එවන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

06. ලංසු විවෘත කිරීම 2025.10.03 දින ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ප.ව. 2.00 ට දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේදී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බව කාරුණිකව සලකන්න.

සභාපති,

ප්‍රසම්පාදන කමිටුව,

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,

නො.211, වක්වැල්ල පාර, ගාල්ල.